ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම මහජන සම්මානය අඛණ්ඩව 9 වසරක් දිනූ ජාතික පුවත්පත

ලංකාදීප

2015 ඔක්තෝබර් මස 1 වැනිදා බ්‍රහස්පතින්දා

ලංකාදීප

# සීමාවාසික වෛද්‍යවරුන්ගේ තෙදින වැඩමුළුව 5දා සිට

(සුජිත් මංගල ද සිල්වා)

සීමාවාසික වෛද්‍යවරුන් සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වාර්ෂිකව සංවිධානය කරන තෙදින පුහුණු වැඩමුළුව ලබන පස් වැනිදා සිට හත් වැනිදා දක්වා කොළඹ ආනන්ද විද්‍යාලයීය කුලරත්න ශාලාවේ දී පැවැත්වේ.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් යුතුව පැවැත්වෙන මේ තෙදින පුහුණු වැඩමුළුවේ දී සීමාවාසික වෛද්‍යවරුන් දහසකට සෑම අංශයක් පිළිබඳවම පුළුල් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පවසයි.

''යහපත් වෛද්‍යවරයා බිහි කිරීම'' යන තේමාව ඇතිව සංවිධානය කරන මේ පුහුණු වැඩමුළුව අදියර තුනකින් ක්‍රියාත්මක වන අතර ඒ යටතේ සීමාවාසික වෛද්‍යවරුන්ගේ ද්‍රවිඩ භාෂා දැනුම, සන්නිවේදන කුසලතා සහ වෘත්තීය කුසලතා සංවර්ධනය කෙරෙන බව කොළඹ විද්වත් වෘත්තිකයන්ගේ සංගම් මූලස්ථානයේ දී ඊයේ (30) පැහැති ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා පැවසීය.

එමෙන්ම වෛද්‍යවරයකුගේ ගති පැවැතුම්, ඇඳුම් පැළඳුම් සහ විලාශයන් පිළිබඳව ද අනෙකුත් වෛද්‍යවරුන් සමග අන්තර් සහයෝගිතාවෙන් යුතුව කටයුතු කරන ආකාරය, සෞඛ්‍ය අමාත්‍යාංශය සමග ගනුදෙනු කරන අයුරු වගේම සෞඛ්‍ය පද්ධතිය පිළිබඳව ද එහිදී සීමාවාසික වෛද්‍යවරුන්ට පුහුණුවක් ලබාදෙන බව වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා පැවසීය.

නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් මගින් සීමාවාසික වෛද්‍යවරුන් වෙත නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ද පුළුල් දැනුමක් ලබාදෙන අතර සීමාවාසික පුහුණුවේදී වෛද්‍ය ශිෂ්‍යයකු වෛද්‍ය වෘත්තිකයකු ලෙස සුහුඹුල්වීම සඳහා සිදු කරගත යුතු වෙනස්කම් පිළිබඳව ද අවබෝධය ලබා දෙන බව ද පාදෙණිය මහතා සඳහන් කළේය.

විශේෂඥ වෛද්‍යවරුන් වන මහාචාර්ය අර්ජුන අලුවිහාරේ, මහාචාර්ය ලලිතා මැන්ඩිස්, මහචාර්ය කාලෝ ෆොන්සේකා, මහාචාර්ය කොල්වින් ගුණරත්න යන විද්වත්හු මේ තෙදින පුහුණු වැඩමුළුවේ දී විශේෂ දේශන පවත්වති.

ගෙවුණු අවුරුදු තුන ඇතුළත දී වෛද්‍යවරුන් 2000ක් සඳහා දෙමළ භාෂා පුහුණුව සාර්ථකව ලබාදී තිබෙන බව පැවසූ වෛද්‍ය අනුරුද්ද පාදෙණිය මහතා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් ලෝකයේ සිටින දක්ෂතම, යහපත්ම සහ පළපුරුදුම වෛද්‍යවරුන් බවට පත් කරමින් සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩි කර සියලු රෝගීන්ගේ අපේක්ෂා සහ බලාපොරොත්තු ඉටු කිරීමේ අරමුණින් බව ද සඳහන් කළේය.

මේ අවස්ථාවට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම් වෛද්‍ය නලින්ද හේරත් සහ වෛද්‍ය දිනේෂාන් රණසිංහ යන මහත්වරු ද එක්ව සිටියහ.